කහවත්ත ප්‍රාදේශීය සභාව
රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2014 ජනවාරි 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
--------------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත අංක 01 හි 21 ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කළ යුතු පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

i. අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා සන්සන්දනය කරන ප්‍රකාශය
ii. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් ඇතුළත් සටහන්.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී ගෙවීම් කර තිබූ 2013 වර්ෂයේ වැය විෂයයන්ට අදාල රු. 139,251 ක බැඳීම් 2013 වර්ෂයේ ණයහිමි ශේෂයට නොගැනීම හේතුවෙන් වර්ෂාවසාන ණයහිමි ශේෂය හා වියදම් එකී වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කරන ලද මුදල් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු රු. 141,282 ක පොළී මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) මුද්දර ගාස්තු ලෙජර් ගිණුමේ ආරම්භක ශේෂය ඉක්මවා ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂ තුල ලද මුද්දර ගාස්තු රු. 1,114,980 ක් ණයගැති ගිණුමට බැර කර තිබූ අතර, මෙකී වටිනාකම සඳහා ණයගැති ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කරමින් ජ'නල් සටහනක් මඟින් වැඩිපුර ලද මුද්දර ගාස්තු ආදායම් සඳහා ගැලපීම් කල යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මුද්දර ගාස්තු ණයගැති ගිණුම හා සමුච්චිත අරමුදල් ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

වත්කම් ගිණුම් 05 කට, වගකීම් ගිණුම් 02 කට හා වැය විෂයයන් 07 කට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන්ගේ එකතුව පිළිවෙලින් රු. 739,571 ක්, රු. 52,652 ක් හා රු. 283,384 ක් ලෙස වෙනස්කම් නිරීක්ෂණය විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|---|
| | ----------------------------------------- | ------------------ |
| (අ) | <u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත</u><br>132 (ඒ) සහ (ඔ) වගන්තිය | අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබානොගෙන 2013 පෙබරවාරි 04 නිදහස් දින වෙනුවෙන් ක්‍රිකට් තරඟයක් සංවිධානය කර රු. 26,716 ක වියදමක්ද, කහවත්ත පලංසූරියගම අවමංගල්‍යාධාර සමිතිය සඳහා 2013 පෙබරවාරි 12 දින රු. 14,400 ක වටිනාකමැති පුටු 18 ක මිලදී ගැනීමක්ද ඇතුළු රු. 41,116 ක වියදමක් සභා අරමුදලින් දරා තිබුණි. |
| (ආ) | <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - 1992</u><br>මුදල් රෙගුලාසි අංක 260, 384 (2) හා 385 | අවස්ථා 45 කදී එකතුව රු. 1,864,707 ක වටිනාකමැති චෙක්පත් බැංකුවේ මුදල් කවුළුවෙන් මුදල් කරගෙන තිබුණි. උක්ත තත්ත්වය දිගින් දිගටම පැවතීම මූල්‍ය අක්‍රමවත් භාවිතයක් මෙන්ම, මූල්‍ය පාලනයේ දැඩි අවදානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. |
| (ඇ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු 2010 පෙබරවාරි 19 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩී.එම්.ඒ./2010(4) චක්‍රලේඛයේ 7 වගන්තිය | චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව 2013 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ ස්ථිර හා අනියම් සේවකයින්ට වැටුප් රු. 3,765,074ක් මුදලින් ගෙවා තිබුණි |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ මෙහෙයුම් අයහාරය රු. 3,199,287 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ මෙහෙයුම් අයහාරය රු. 4,545,796 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 1,346,509 කින් අඩුවී තිබූ අතර, එය සියයට 30 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් වල වැඩිවීමත්, වරිපනම් බදු ආදායම අඩුවීමත් වේ.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 2,497 | 2,772 | (275) |
| බදු කුලී | 5,396 | 3,189 | 2,207 |
| බලපත්‍ර ගාස්තු | 691 | 753 | (62) |
| වෙනත් ආදායම් | 4,040 | 4,095 | (55) |

#### 2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම හා සත්‍ය ආදායම සැසඳීමේදී බදු කුලී ආදායමේ රැස්කල ආදායම සියයට 41 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

#### 2.3.3 වරිපනම් බදු

2013 දෙසැම්බර් මස 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 04 ක් ඉක්මවා බදුකරුවන් 838 දෙනෙකුගෙන් රු. 2,952,644 ක් අය වීමට තිබූ අතර, හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති පරිදි අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.4 කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

---

සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති ඉහත බදු අයකල යුතු ව්‍යාපාර හඳුනා ගැනීම උදෙසා වාර්ෂික සමීක්ෂණයක් විගණිත දිනය වන 2014 පෙබරවාරි 10 දින වන විටද සිදුකර නොතිබුණි. එබැවින් ඉහත බදු වලට අදාල ආදායම් ලේඛණය පවත්වා ගෙනයනු ලබන්නේ ආයතනයට ව්‍යාපාර වර්ගය අනුව එකතුවන ආදායම පදනම් කරගෙන බව නිරීක්ෂණය විය. 2012 හා 2013 වර්ෂ වලට අදාලව කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු වලට අදාල රු. 118,850 ක හිඟහිටි අවස්ථා 172 ක් නිරීක්ෂණය විය.

2.3.5 අක්කර බදු

---

හිඟ අක්කර බදු ලෙස 2013 දෙසැම්බර් 31 දිනට පුද්ගලයින් 38 දෙනෙකු වෙතින් වර්ෂ 01 සිට වර්ෂ 04 ඉක්මවූ හිඟ රු. 53,794 ක් අයවීමට තිබූ අතර, හිඟ මුදල් අයකර ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.3.6 කඩබදු

---

පළාත් පාලන කොමසාරිස්ගේ 2009 මාර්තු 09 දිනැති අංක 2009/01 දරන චක්‍රලේඛයට අනුව කඩකාමර බදු දීමේදී අදාල ගිවිසුම් වාර්ෂිකව අළුත් කිරීමට පියවර ගතයුතු වුවද, සභාව සතු කඩකාමර බදු දීමේදී එලෙස වාර්ෂිකව ගිවිසුම් අළුත් කිරීමක් සිදුකර නොතිබුණි. එසේම අදාල කඩකාමර වල බදු මුදල් අවම වශයෙන් වර්ෂ 05 කට වරක්වත් තක්සේරු කල යුතු වුවද, ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

2.3.7 දැන්වීම් පුවරු ගාස්තු

---

සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශිත දැන්වීම් හා බැනර් විශාල ප්‍රමාණයක් භෞතිකව නිරීක්ෂණය වූ අතර, ඒ සම්බන්ධ ස්ථිර හා තාවකාලික දැන්වීම් පුවරු ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. දැන්වීම් හා බැනර් ප්‍රදර්ශනයට අවසර ලබාදීම මඟින් උපයාගනු ලබන ආදායම් පිළිබඳ ප්‍රමාණවත් හා නිවැරදි තොරතුරු ලේඛණගත කර නියමිත ආදායම් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

2.3.8 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

---

සභා බල ප්‍රදේශය තුල පිහිටවූ සම්ප්‍රේෂණ කුළුණු සඳහා කිසිදු ගාස්තු අය කිරීමක් සිදු කර නොමැති අතර, නියමිත අවසර දීමට අදාලව විධිමත් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි.

2.3.9 වෙනත් ආදායම්

---

සභා බල ප්‍රදේශය තුල ක්‍රමානුකූල නොවූ ත්‍රීරෝද රථගාල් ගණනාවක් දක්නට ලැබූ නමුත්, ඒ සඳහා නිශ්චිත ස්ථානයක් සලකුණුකර පහසුකම් සලසා දීමෙන් අනතුරුව අතුරු ව්‍යවස්ථාවක් පනවා වාර්ෂිකව හෝ මාසිකව සභාවට ආදායමක් ලබා ගැනීමට වැඩපිළිවෙලක් විගණිත දිනය වූ 2014 පෙබරවාරි 18 දින දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

2.3.10 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු වටිනාකම රු. 6,005,012 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා බැංකුවේ ගිණුම් අංක 4390931 ට අදාල බැංකු සැසඳුම සැකසීමේදී මුදල් පොතේ ශේෂය සමඟ බැංකු ගිණුමේ ශේෂය සැසඳීම වෙනුවට ආරම්භක දිනට බැංකු ශේෂය හා එකී මාසයට අදාලව ප්‍රධාන ගිණුමට සෑම මසකම එක්වන් මුදල් වශයෙන් ලැබෙන තැන්පත් පදනම් කරගෙන 2013 ඔක්තෝබර් මස සිට වියදම් පමණක් සටහන් කර තිබුණි. මෙම ගිණුමට අදාල ලැබීම් ප්‍රධාන මුදල් පොතේ ලැබීම් වශයෙන් දක්වා තිබුණි. 2013 ඔක්තෝබර් මස සිට දෙසැම්බර් මස දක්වා එක්වන් මුදල් ලෙස ලැබූ රු. 4,786,667 ක මුදල ශේෂ පත්‍රයේ වර්තමාන බැංකු ශේෂය වශයෙන් දක්වා තිබූ අතර, එකී ශේෂය මුදල් පොත මඟින් තහවුරු නොවුණි.

(ආ) ඇන්දාන ප්‍රදේශයේ ජනතාවගේ ජල අවශ්‍යතාවයන් සපුරාලනුවස් ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජල ව්‍යාපෘතියට අදාලව ජල පාරිභෝගිකයන්ගෙන් අයවිය යුතු හිඟ ජල බිල්පත් අයකර ගැනීම උදෙසා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් කාර්යාලය සතුව නොතිබූ අතර, මෙම ජල ව්‍යාපෘතියට අදාලව යොදා ඇති ජල මීටර බොහොමයක් පරීක්ෂණ දිනය වූ 2014 පෙබරවාරි 18 දින වනවිටත් ක්‍රියාවිරහිත වී තිබුණි.

(ඇ) 2012 භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා ඉන්වෙන්ට්‍රි ලේඛණය අනුව සභාව සතු අංක 46-4075 දරණ ට්‍රැක්ටර් ට්‍රේලරය භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මඟින් භෞතිකව හඳුනාගෙන තිබුණද, දැනට එය සභාව සතුව නොමැති බව විගණනයට අනාවරණය විය. එය අස්ථානගත වීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පැහැදිලි කිරීමක් අදාල පාර්ශවයන් වෙතින් විගණනයට ඉදිරිපත් නොකෙරුණි

3.2 අවිධිමත් ගනුදෙනු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැප්ටොප් ලබා ගැනීම සඳහා වන ණය මුදල ලබා දීමට 2013 අප්‍රේල් 10 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය ප්‍රකාරව අනුමැතිය ලබා දී නොතිබියදී, 2013 අප්‍රේල් මස මන්ත්‍රීවරුන් 06 දෙනෙක් සඳහා රු. 420,000 ක් සභා අරමුදලින් ගෙවා තිබූ අතර, අදාල ණය මුදල ලැප්ටොප් මිලදී ගැනීම සඳහා වැය කළ බවට තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වල නියෝජිතයන් සඳහා තායිලන්තයේදී පවත්වනු ලබන 3R සංකල්පය හා ආපදා කළමනාකරණ පිළිබඳව පෞද්ගලිකව ලද ආරාධනාවක් මත වැඩමුළුවක් සඳහා දින 05 ක කාලයකට එනම්, 2013 ජුනි 07 සිට 2013 ජුනි 11 දක්වා පුද්ගලික ආයතනයකට එක් සභිකයෙකු සඳහා රු. 89,000 බැගින් ප්‍රාදේශීය සභා සභිකයින් 06 දෙනෙකු වෙනුවෙන් රු. 534,000 ක මුදලක් 2013 ජුලි 17 දින සභා අරමුදලින් ගෙවා තිබුණි. විගණිත දිනය වූ 2014 පෙබරවාරි 18 දින වනවිටත් උක්ත වැඩමුළුව සඳහා සභිකයින් සහභාගී වී නොතිබුණි

(ඇ) සභාව සතු අංක එල්එෆ් 7471 දරණ මහේන්ද්‍රා කැබ් රථය අක්‍රීය බැවින් රාජකාරී අවශ්‍යතාවය සඳහා ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය මත නව කැබ් රථයක් සමාලෝචිත වර්ෂය තුලදී කුළී පදනම මත ලබා ගෙන ඇතත් සභාව සතු පැරණි කැබ් රථය අක්‍රීය වී ඇති බවට ඉංජිනේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි. තවද, මෙම වාහන කුළියට ගැනීමේදී එහි තිබිය යුතු ගුණාංග හඳුනාගෙන පිළිගත් ක්‍රමවේදයක් මත ප්‍රසිද්ධ මිල කැඳවීම් අවශ්‍යතාවයට ගැලපෙන වාහනයක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් ලබා ගැනීම වෙනුවට මාසික කුළිය රු. 70,000 ක් ගෙවීමේ පදනම මත කිසිඳු ගිවිසුමකින් තොරව 53-6322 අංක දරණ කැබ් රථය කුළී පදනම මත ලබාගෙන තිබුණි. අදාල රථය සඳහා 2013 ඔක්තෝබර් සිට 2013 දෙසැම්බර් දක්වා වාහන කුළිය ලෙස රු. 210,000 ක්ද, ඉන්ධන වියදම් සඳහා රු. 190,878 ක්ද, රියදුරු සඳහා රු. 64,756 ක්ද, ලෙස මාස තුනක කාලයක් සඳහා සභා අරමුදලින් රු. 465,634 ක් වියදම් දරා තිබුණි.

(ඈ) ප්‍රාදේශිය සභා සභිකයින් 4 දෙනෙකු සඳහා උත්සව අත්තිකාරම් ලෙස රු. 64,500 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබූ අතර, ඒ සඳහා කිසිඳු අනුමැතියක් ලබාගෙන නොතිබුණි

3.3 පරිසර කළමනාකරණය

------------------------------

වර්ෂ ගණනාවක සිට ඇඹිලිපිටිය - රත්නපුර ප්‍රධාන මාර්ගයේ දෙපස මහා පරිමාණයෙන් පවත්වාගෙන යනු ලබන මාළු වෙළඳාම හේතුවෙන් ප්‍රධාන මාර්ගයේ ගමනාගමනයට බාධා වී තිබූ අතර, හදිසි අනතුරු, මාර්ග අවහිරතා මෙන්ම අධික දුර්ගන්ධයක්ද ප්‍රදේශයේ පැතිරී තිබුණි. මාළු වෙළඳපල අසලින් ගලා බසින දියපාරට මෙම ස්ථානයේ අපද්‍රව්‍ය සේදීගොස් එකතුවීම මහින් පරිසර දූෂණයක්ද සිදුවී තිබුණි.. 2007 ඔක්තෝබර් 24 දින පැවති මහ සභාවේ සම්මත කර 2010 මැයි 07 දින රජයේ ගැසට් පත්‍රයේ පළකර පිළිගෙන තිබූ 261 අධිකාරිය වන 1952 අංක 6 දරණ පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (i) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සභාවේ සභාපති තුමාගෙන් විධිමත් පරිදි ලබාගත් බලපත්‍රයක් මත මාළු වෙළඳාම පවත්වාගෙන යාම සිදුකල යුතු වුවත්, ඒ පිළිබඳව නොසලකා ඉහත මාළු වෙළඳසැල පවත්වාගෙන යාම සිදුකර තිබුණි.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

1988 (ප්‍රාදේශිය සභා) මූල්‍ය පරිපාලන රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

වැය විෂයයන් 35 කට අදාලව සමාලෝචිත වර්ෂයේ සලසා තිබූ ප්‍රතිපාදන රු. 40,400,500 ක් කිසිදු වියදමක් නොදරා මුළුමනින්ම ඉතිරි වී පැවතුණි.

5. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය